# 3. අල් අඞ්ලාක්

## 3:1 මිනිස් යහගුණාංගයන් වර්ධනය කිරීම සඳහා ඇති මූලික කරුණු

- සිත් පවිත්‍රභාවය හා යහ ගුණාංග ඇති සමාජයක් ඇති කිරීම ඉස්ලාමයේ අරමුණ වේ.
- සිත් පවිත්‍රභාවයට අල්ලාහ් මත තබන්නා වූ ආදරය හා ඔහු මත ඇති දේව භක්තිය මුල් වේ.
- මිනිස් ජීවිතය සරු කර ගැනීමට තවක්කුල් නැමැති භාර කිරීම හා රිලා නැමැති තෘප්තිය ප්‍රධාන ගුණාංග වේ.
- තමන්ගේ වැරදි ක්‍රියාවන් සඳහා බැගෑපත් වී පාපොච්චාරණයේ යෙදීම ජීවිතය සාරවත් කරයි.

මිනිසා අල්ලාහ් විසින් මවනු ලැබූ ගෞරවනීය මැවීමකි. මොහුගේ ආත්මය බොහෝ ප්‍රශංසාවට ලක්වූ ගති පැවතුම් වලින් ද පිළිකුලට ලක්වූ ගුණාංගයන්ගෙන් ද සමන්විත ය. ඔහුව එක් වගා බිමකට සංසන්දනය කළ හැක. එම වගා බිම ක්‍රමානුකූලව උපයෝගී කරන අවස්ථාවේ දී ප්‍රයෝජනවත් ධාන්‍යයන් වැඩෙන්නේ ය. එය නොසැලකිලිමත් කමින් අත්හරින විට කටු පඳුරු වලින් පිරුණු වනාන්තරයක් බවට පත් වන බව අපි දනිමු. මෙසේ මිනිස් ජීවිතය ක්‍රමානුකූලව සැකසෙන විට යහපත් ප්‍රතිඵල ගෙනදෙන අතර අක්‍රමානුකූලව සැකසෙන විට අයහපත් ප්‍රතිඵල ගෙන දෙන්නේ ය.

ඉස්ලාම් යනු මිනිසා තුළ තිබෙන්නාවූ උසස් ගුණාංගයන් පිළිබිඹු වීම පිණිස අල්ලාහ් විසින් ප්‍රදානය කරන ලද මාර්ගයකි. එම නිසා එක් මුස්ලිම්වරයකු සෑම අවස්ථාවක දී ම තමන් ව එක් උදාර පුරුෂයෙක් ලෙස මාරු කරගත යුතුයි. ඒ සඳහා ඉස්ලාමය මාර්ගයන් කිහිපයක් හඳුන්වා දී ඇත.

**(1). හවුෆ් නැමැති දේව භය.**
**(2). රජාඋ නැමැති අපේක්ෂා සහිත ආදරය**
**(3). තවක්කුල් නැමැති භාර කිරීම.**
**(4). තව්බා නැමැති පාපෝච්චාරණය.**
**(5). රිලා නැමැති තෘප්තිමත් ව පිළිගැනීම.**

මෙම යහ ගුණාංගයන් හරි හැටි දැනගෙන එය සිත් පතුලේ ගැබ් කරගත යුතුයි. ඉහත සඳහන් යහ ගුණාංගයන් සිත නැමැති වගා බිමේ ධාන්‍යයන් වන විට එහි ආදරය, දන් දීම, පරිත්‍යාගශීලි භාවය වැනි මිනිස් ජීවිතය සරු කරන්නාවූ යහ ගුණාංගයන් ද උසස් ගති පැවතුම් ද පිට වීමට පටන් ගනී.

**එම නිසා මෙම පාඩම කොටස් තුනකට බෙදමු**

(1). අප යහගුණ ඇත්තන් බවට පත්කරන්නාවූ උසස් ගුණාංගයන්ගෙන් ප්‍රධාන ගුණාංගයන් විමසීම.

(2). යහ ගුණාංගයන්ගේ උච්චස්ථානය ලෙස සැලකෙන ආදරය, දන්දීම, පරිත්‍යාගශීලි භාවය යන දේ ගැන විමසීම.

(3). මෙම ගුණාංගයන් ලබා ගැනීමට අවශ්‍යවන ජීවිතයේ ප්‍රධාන වැදගත් අවස්ථාව වන යොවුන් විය පිළිබඳව විමසීම.

මෙම කොටසේ හව්ෆ්, රජාඋ, තවක්කුල්, තවුබා, රිලා වැනි ප්‍රධාන යහගුණාංගයන් ගැන සලකා බලමු. මෙම ගුණාංගයන් ඇති සිත් යහපත් ප්‍රතිඵල ගෙන දෙන අතර අල්ලාහ්ගේ තෘප්තිය ද ඇති කරයි. එපමණක් නොව ආදරය, දන්දීම, පරිත්‍යාගශීලි භාවය යනාදි උසස් ගුණාංගයන් වර්ධනය කරවයි.

අපව යහගුණවලින් පිරිපුන් පුද්ගලයන් බවට පත් කරවන සමහර කරුණු

## හව්ෆ්/රජාඋ

හව්ෆ් යන අරාබි පදයට බිය, භක්තිය යනුවෙන් ද, රජාඋ යන අරාබි පදයට අපේක්ෂා සහිත ආදරය යනුවෙන් ද අර්ථ දක්වනු ලබයි. මෙම ගුණාංගයන් දෙක එකිනෙකට විරුද්ධ වූ අර්ථයන් ඇති වචනයන් වන්නේ ය. ඊමාන් ඇති එක් මිනිසෙකු ගේ සිත් පතුලේ මෙම ගුණාංගයන් දෙක සෑම අවස්ථාවක ම පැවතෙන්නේ ය.

අල්ලාහ් අපගේ ස්වාමියා ය. අප කරන්නා වූ ඕනෑම සුළු අකුසල් ක්‍රියාවක් සඳහා අපට දඬුවම් කිරීමට හෝ ඔහුගේ දයාවෙන් ඕනෑම මහා පරිමාණයේ අකුසල් ක්‍රියාවක් ක්ෂමා කිරීමට ද සම්පූර්ණ අයිතිය ඇත්තෙකි. මෙය සිතට ගෙන බිය භක්තියෙන් හා අපේක්ෂා සහිත ආදරයෙන් ජීවත් වීම. මූඃමින් වරයෙකුගේ වගකීම වන්නේ ය.
අල්ලාහ් කුර්ආනයේ

"ඔහු කරන්නාවූ කාර්යයන් සඳහා ප්‍රශ්නයට ලක්කිරීමට නොහැකි ය. නමුත් මිනිසා ප්‍රශ්න කිරීම්වලට ලක් වේ" යනුවෙන් පවසයි.

තව ද මිනිස් සිත් අඩුපාඩුවලින් හා උසස් ගති පැවතුම් ඇති ස්ථානයක් වන අතර එහි උසස් ගති ගුණ පිළිබිඹු විමට හා අඩුපාඩු මඟහරවා ගැනීමටත් හව්ෆ් හා රජාඋ මහත් සේ රුකුලක් වන්නේ ය. මේ ගුණාංග දෙකෙන් එකක් ලබාගන්නා විට මිනිස් ජීවිතය බොඳ වී යන්නේ ය. හව්ෆ් නැමැති බිය, භක්තිය පමණක් තිබිම, මිනිස් ජීවිතයේ දියුණුවට බාධා වන අතර රජාඋ නැමැති අපේක්ෂා සහිත ආදරයෙන් පමණක් ජීවත් විම මිනිසා අවිනීත මිනිස් සත්වයෙක් බවට පත් කරන්නේ ය.

එම නිසා මෙම ගුණාංගයන් දෙක මිනිසාගේ ක්‍රියාවලියෙන් මධ්‍යස්ථ කර ස්වභාවික ගති පැවතුම් මතු කිරීමට උපකාරී වන අතර මෙය අපගේ උසස් ගුණාංගයන් මතු කිරීමට ද උපකාරී වන්නේ ය. අල්ලාහ්ට ඇති බිය හා අපේක්ෂා සහිත ආදරය, ජීවිතයේ ඇතිකරන බලපෑම් පිළිබඳ අපි සලකා බැලුවෙමු.

මෙම ගුණාංගයන් ගැන අල්ලාහ් අල්කුර්ආනයේ

" إِنَّهُ لاَ يَيْئَسُ مِنْ رَوْحِ اللهِ إِلاَّ الْقَوْمُ الْكَافِرُوْنَ "

"නිශ්චය වශයෙන් ම (අල්ලාහ්ව විශ්වාස නොකරන්නාවූ) ප්‍රතික්ෂේප කරන්නන් හැර (අන් අය) අල්ලාහ්ගේ කරුණාවෙහි අවිශ්වාසයක් ඇති නොකර ගනී." (12:87) යනුවෙන් ද

" قُلْ يَاعِبَادِيَ الَّذِيْنَ أَسْرَفُوْا عَلَى أَنْفُسِهِمْ لاَتَقْنَطُوْا مِنْ رَحْمَةِ اللهِ إِنَّ اللهَ يَغْفِرُ الذُّنُوْبَ جَمِيْعًا "

"තමන් හට (තමන් ම) අප්‍රමාණ (පාපයන්) කරගත්තාවූ මාගේ ගැත්තාණනි! අල්ලාහ්ගේ කරුණාවෙන් (ඔහුගේ සමාවෙන්) අපේක්ෂා භංගත්වයට පත් තැනැත්තන් හැටියට ඔබලා නොවන්න. අල්ලාහ් පාපයන් සියල්ල සමා කරන්නේ ය." (39:53) යනුවෙන් ද සඳහන් වේ.

## තවක්කුල්

තවක්කුල් යන්න "බාර කිරීම", යනුවෙන් අර්ථ දක්වනු ලබයි. මිනිසා තමාගේ කාර්යයන් සාර්ථක වීමට කැමැත්තක් දක්වන්නේ ය. ඒ වෙනුවෙන් උත්සාහයන් ද කරන්නේ ය. එක් මුස්ලිම් වරයෙක් තමන්ගේ කාර්යයන් සාර්ථක වීම සඳහා උත්සාහ කළ යුතු අතර එය සාර්ථක වීමට අල්ලාහ්ගේ දයාව බලාපොරොත්තු වීම අනිවාර්ය වන්නේ ය. ඒ සඳහා ඔහු සිය කාර්යයන් අල්ලාහ් වෙත බාර කරන්නේ ය. මෙය තවක්කුල් නම් වේ.

තව ද, මිනිසා බෙලහීනත්වයෙන් යුක්තව මවනු ලැබ ඇත. ඔහුගේ උත්සාහයන් ද එලෙස ම බෙලහීනත්වයෙන් යුක්ත ය. අල්ලාහ් අදෘෂ්‍යමාන වූ සියල්ල හොඳින් දන්නෙකි. එම නිසා ඔහු අපට දායාද කළ උපදෙස් ප්‍රයෝජනයට ගෙන ෂරීඅතයේ සීමාව තුළ අපගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා උපකාරීවන සියලු ම දේ සැලසුම් කර ගැනීමට ඉස්ලාම් අප ව උනන්දු කරවයි.

අල්ලාහ් කුර්ආනයේ "අල්ලාහ් තමාගේ ගැත්තන් හට නිර්ණය කර ඇති මෙලොව වස්තූන් තහනම් කරන්නේ කවුරුන් ද"? යනුවෙන් අසා ඇති අතර අල්ලාහ් වෙත සියලුදේ භාර කරන ලෙස අපට ආඥා කර ඇත. අල්ලාහ් කුර්ආනයේ "විශ්වාසවන්තයින් අල්ලාහ් වෙත පමණක් තමන්ගේ කාර්යයන් භාර කරත් වා!"

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් "ඔබලා සත්‍ය ලෙස අල්ලාහ් වෙත තවක්කුල් තබන්නේ නම් පක්ෂින්ට ආහාර සපයන්නා සේ ඔබලාටත් ආහාර සපයයි. පක්ෂින් උදය කාලයේ හිස් කුසින් පිටවන අතර සවස් කාලයේ කුස පිරුනු ලෙස පැමිණෙන්නේ ය". යනුවෙන් පැවසුහ.

එම නිසා අප යම් කිසි කාර්යයක යෙදෙන විට පහත සඳහන් කරුණු ගැන සැලකිල්ලට ගත යුතුයි.

(1). අපගේ අවශ්‍යතාවයන් ඉටුකිරීමට ගන්නාවූ සෑම උත්සාහයක් ම ඉස්ලාමයේ සීමාව ඉක්ම නොවිය යුතුයි.

(2). තමන්ගේ උත්සාහය පමණක් විශ්වාස නොකොට එහි ප්‍රතිඵලය අල්ලාහ් සතුව ඇති බව සිතට ගැනිම.

(3). "සිදු වන්නාවූ කාර්යයන් අපට පක්ෂව නොතිබුනත් අල්ලාහ් යහපතක් සිදු කරයි" යනුවෙන් විශ්වාස කර සිත සන්සුන් කර ගත යුතුයි.

මෙසේ ක්‍රියා කරන මුඃමින් වරයෙක් මෙලොවෙහි ද පරලොවෙහි ද සැනසිල්ලෙන් හා සතුටින් කාලය ගතකරන අතර ඔහු කළ උත්සාහය ද අපතේ නොයන්නේ ය. එයට යහපත් ප්‍රතිඵලයන් ද ලැබෙන්නේ ය. එම නිසා අපි සියලු දෙනා මෙම උසස් ගුණාංගය වර්ධනය කර ගැනිමට උත්සාහ කරමු.

## රිලා

රිලා යනු තෘප්තිය යනුවෙන් අර්ථ දක්වන වචනයකි. අපට අල්ලාහ්ගේ නියමයෙහි සිදුවන්නාවූ සෑම සිදුවීමක් ම පිළිගෙන සිත තෘප්තිමත් කර ගැනීම රිලා යනුවෙන් කියනු ලැබේ.

එම නිසා අප අපගේ කාර්යයන් සියල්ල අපගේ කැමැත්ත පරිදි ඉටුවිය යුතු යනුවෙන් සිතා අපගේ සිත් නොසන්සුන් තාවයකට පත් නොකර රිලා නැමැති තෘප්තිය ඇති කර ගෙන සැනසිල්ලෙන් ජීවත් විය යුතු අතර මෙවැනි ගුණාංගයන් සඳහා අන් අය ද උනන්දු කරවීම අපගේ වගකීමකි.

## තව්බා

තව්බා යන පදය, "පව්වලින් මිදීම", යනුවෙන් අර්ථ දක්වයි. මිනිසා පාපයන් කිරිමට සමහරක් පාරිසරික හේතූන් බලපායි. මිනිසාගේ පරිසරය පව් කිරිමට මග පාදන්නේ ය. සමාජයේ එක් රැස්ව ඇති නොයෙකුත් වැරදි ක්‍රියාවන් පාපයන් කිරීමට හේතු වන්නේ ය. මෙයින් තමාගේ ආත්මය විනාශ වන්නේ ය.

එම නිසා කාරුණිකවූ අල්ලාහ්, එයින් නිදෙස් වී මනස පරිශුද්ධ කර ගැනීමට "තව්බා" නැමැති තමන් කළ පාපයන් සඳහා බැගෑපත් වී පව්වලින් නිදෙස් වීමේ අවස්ථාවන් පෙන්නුම් කර ඇත. අල්ලාහ් කුර්ආනයේ

" يَاأَيُّهَا الَّذِيْنَ آمَنُوا تُوبُوا إِلَى اللهِ تَوْبَةً نَصُوحًا "

"විශ්වාස වන්තයිනි, අල්ලාහ් වෙත සත්‍ය ලෙස තව්බා කර නැවත පැමිණෙන්න." (66:8)

තව ද අපගේ ජීවිතයේ අභිවෘද්ධියට ඇති මග නම් පව් වලින් නිදොස් වී ජීවත් වීමයි. එනම් නබි නූහ් අලෛහිස්සලාම් තුමා තම සමාජය බලා කී දේ අල්ලාහ් කුර්ආනයේ මෙසේ විස්තර කරයි.

" اِسْتَغْفِرُوْا رَبَّكُمْ اِنَّهٗ كَانَ غَفَّارًا ۙ يُرْسِلِ السَّمَاۗءَ عَلَيْكُمْ مِّدْرَارًا ۙ وَيُمْدِدْكُمْ بِاَمْوَالٍ وَّبَنِيْنَ وَيَجْعَلْ لَّكُمْ جَنّٰتٍ وَّيَجْعَلْ لَّكُمْ اَنْهٰرًا "

" එම නිසා ඔබලාගේ පව් වෙනුවෙන් ඔබලාගේ ස්වාමියාගෙන් (අල්ලාහ්ගෙන් ) සමාව අයදින්න. නිත්‍ය වශයෙන් ම ඔහු සමා කරන්නෙකු වන්නේ ය. එසේ ඔබ කරන්නේ නම් වර්ෂාව ඔබට නිතැතින් ම වස්සනු ලබයි. වස්තූන් හා පිරිමි දරුවන් ලබා දීමෙන් ඔබට උදව් කරයි. තව ද වතු යායන් ඇති කරයි. තව ද ගංගාවන් ඇති කරයි." (7110.12)

නබි තුමාණන් ද මෙසේ සඳහන් කර ඇත. "බස්නාහිරින් සූර්යයා උදා වන තෙක් දවල් කාලයේ වැරදි ක්‍රියා කරන්නන් තව්බා කර යහ මග යෑම සඳහා රාත්‍රි කාලයේ ද රාත්‍රි කාලයේ වැරදි ක්‍රියා කරන්නන් තව්බා කර යහ මග යෑම සඳහා දවල් කාලයේ ද අල්ලාහ් නිත්‍යවශයෙන් ම තමාගේ දෑත් දිග හරින්නේ ය. (තව්බාව පිළිගන්නේ ය)"
(මුස්ලිම්)

එම නිසා අපගෙන් සිදුවන්නාවූ වැරදි ගැන සිතා බැගෑපත් වී පව්වලින් සමාව අයදින්නන් විය යුතුයි.

මිනිස් අයිතිවාසිකමට සම්බන්ධ නොවන අල්ලාහ්ට හා ඔහුගේ ගැත්තන් අතර ඇති යුතුකම් විෂයෙහි කෙනෙකු අඩුපාඩු ඇති කරයි නම් ඔහු එයින් තව්බා කිරීමට පහත සඳහන් කොන්දේසි තුන පිළිපැදිය යුතුයි.

**(1). තමා මේ දක්වා කළ පාපයන්ගෙන් මුළුමනින් ම වැළකී සිටිය යුතුයි.**
**(2). තමන්ගේ පාපයන් ගැන සිතා සිත් පතුලෙන් බැගෑපත්වී වැළපිය යුතුයි.**
**(3). මින් ඉදිරියට එම පාපය නොකරන බවට අධිෂ්ඨාන කර ගත යුතුයි.**

මෙම කොන්දේසි තුනෙන් එකක් හෝ අත්හරින විට ඔහුගේ පාපොච්චාරණය තව්බාවක් ලෙස පිළිගනු නොලබයි.

අල්ලාහ්ගේ ගැත්තන්ට (මිනිසුන්ට) කළ යුතු යුතුකම් වලට අඩුපාඩු කළේ නම් ඉහත කී කොන්දේසි තුන සමග තවත් කොන්දේසියක් එක් කළ යුතුයි. එනම් අපරාධයට ලක් වූ අයට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබාදීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් ඔහුගෙන් සමාව අයදිය යුතුයි.

## අභ්‍යාස

1). හවුෆ්, රජාඋ යන ගුණාංගයන් දෙකෙහි අරමුණ හා මිනිස් ජීවිතයට ඒවා මගින් ඇති වන්නාවූ ප්‍රතිඵලයන් විස්තර කරන්න.
2). "මිනිස් ආශාවන් සියල්ල මෙලොව දී ඉටුකරගත නොහැක" යන යථාර්ථය අවබෝධ කරදෙන උදහරණ දෙකක් පවසන්න.
3). ඊමානයේ සමහර ගුණාංගයන් හැඳැරූ අප, එය ජීවිතයේ ඇතිකර ගැනීමට ගන්නා පියවරයන් කුමක්දැයි පවසන්න.
4). තවක්කුල් ගැන විස්තර කරන්න.
5). අපි තව්බා කළ යුත්තේ ඇයි?, එහි කොන්දේසි සියල්ල පවසන්න.

**පහත සඳහන් අරාබි වචනයන්ගේ තේරුම පවසන්න**.

1. හවුෆ් 2. රජාඋ 3. තවක්කුල් 4. රිලා 5. තව්බා

## 3.2 ආදරය,දන්දීම හා පරිත්‍යාගශීලීභාවය

- ආදරය පෙන්වීම යහ ගුණාංගයන්ගේ යථාර්ථය වේ.
  - දන් දෙන්නා වූ මිනිසා අල්ලාහ්ගේ හා ඔහුගේ ගැත්තන්ගේ ආදරයට ලක්වන අතර ගෞරව කරනු ලබන්නේ ය.
  - යහ ගුණයේ උච්චස්ථානය පරිත්‍යාගශීලී භාවය වේ.

ඉහත පරිච්ඡේදයේ සඳහන් කරනු ලැබූ යහ ගුණාංගයන් සිත් තුළ වර්ධනය වන විට තමන්ගේ ජීවිතය අන් අයගේ යහපත උදෙසා ක්‍රියා කරන අතර අල්ලාහ්ගේ ආදරය ලැබූ තැනැත්තෙකු බවට ඔහු පත් වන්නේ ය.

අනුන්ගේ යහපත උදෙසා ක්‍රියා කිරීමට නම් අප තුලින් ඇති වන්නාවු ප්‍රධාන ගුණාංගයන් තුනක් මුල් කොට ගෙන එය සිදුවේ. ඒවා නම්

**(1). ආදරය**
**(2). දන්දීම**
**(3). පරිත්‍යාගශීලිභාවය වේ.** මෙම ගුණාංගයන් තුන ම වෙන්වෙන් ව සලකා බලමු.

### ආදරය

ආදරය යනු මිනිස් ස්වභාවයේ ඇති ගුණාංගයන්ගෙන් ඉතා උසස් ගුණාංගයකි. පොදුවේ මිනිසා තමන් සමග ද තමන් වටා සිටිනවුන් සමග ද ආදරය කිරීම ස්වභාවයකි. සමහර අවස්ථාවල ආදරයේ යථාර්ථය හරි හැටි නොදන අන් අයගේ යහපත උදෙසා ක්‍රියා කිරීම වැනි උසස්ගුණාංගය අතහැර තම යහපත වෙනුවෙන් පමණක් ආදරය කිරීම අප තුළ දක්නට ඇත. එම නිසා ඉස්ලාමය තහවුරු කරන ආදරයේ යථාර්ථය දන ක්‍රියා කරමු.

මිනිසුන් වන අපි සියල්ලන් ම අල්ලාහ් මැවූ මැවීම්වල අංගයන් වන්නෙමු. එම නිසා අප අතර ඇති බැඳීම දේවත්ව බැඳීමක් වන්නේ ය. මෙම විශිෂ්ට බැඳීම අරමුණු කොට ගෙන අල්ලාහ්ගේ තෘප්තිය පමණක් බලාපොරෙත්තුවෙන් ඇතිකරගන්නා ආදරය යථාර්ථය වන්නේ ය. අල්ලාහ් වෙනුවෙන් පමණක් ආදරය කරන්නා හට අල්ලාහ් ආදරය කරන්නේ ය. අල්ලාහ් හදීසුල් කුදිසියක මෙසේ සඳහන් කරයි :

"මා වෙනුවෙන් ඔබලා එකිනෙකා අතර සබඳකම් පැවැත් වූ අය කොහි ද? අද දින (කියාමත් දින) මාගේ අර්ෂයේ (සිංහාසනයේ) සෙවණැල්ල ඔවුන්ට සෙවණැල්ලක් වේ." යනුවෙන් ද තවත් හදීසයක "ආදරය කරන්නන් සමග අල්ලාහ් ආදරය කරන්නේ ය" යනුවෙන් ද සඳහන් වේ.

මිනිසා සමග ආදරය කරන්නන් සමග අල්ලාහ් ආදරය කරන්නා සේ, මිනිසා ද ආදරය කරයි. එයට විරුද්ධව කෘුර සිත් ඇති දැඩි ගුණාංග ඇත්තන් අල්ලාහ් පිළිකුල් කරන්නා සේ මිනිසා ද පිළිකුල් කිරීම අප දන්නා කරුණකි. අපගේ නායකයා හා අල්ලාහ් ගේ දූතයා වන මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් ආදරයේ සංකේතයක් ව ජීවත් වී පෙන්වන ලදි.

"කෘුර භාවයෙන් ඉටු කළ නොහැකි දේ ආදරය මගින් ඉටු කළ හැකි ය." යන්න දන්නා කරුණකි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මක්කා ජයග්‍රහණය කළ අවස්ථාවේ දි තමන්ට හා මුස්ලිම්වරුන් හට නොකඩවා හිරිහැර කල කුරෛෂි කාෆිර්වරුන්ට දයාන්විතව හා කරුණාබරව සමාව දී ආදරය කළ හෙයින් ඔවුන් සියලුදෙනා සත්‍ය ඉස්ලාමය වැළඳගෙන ඉස්ලාමය වෙනුවෙන් බොහෝ සේවය කළ බව ඉස්ලාමීය ඉතිහාසය මගින් පෙන්නුම් කෙරේ. මේ නිසා ම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් තමන්ගේ පැමිණීමේ අරමුණ මෙසේ පැහැදිලි කළේ ය.

**"මම හොඳ ගති ගුණ සම්පූර්ණ කිරීමට ම යවනු ලැබුවෙමි"**

ආදරය පෙන්වන්නන්, ආදරය කරන ආකාරය අනුව කොටස් කිහිපයකට බෙදිය හැකි ය.

**(1). ගැත්තන් තමන්ගේ ස්වාමියා වන අල්ලාහ් ට හා ඔහුගේ දූතයාණන්ට තබන්නාවූ ආදරය.**

**(2). ගැත්තන් අල්ලාහ්ගේ ආදරයට පාත්‍ර වූ සහාබාවරුන්, ආලිම්වරුන්ට හා සාලිහින් වරුන් ට තබන්නාවූ ආදරය.**

**(3). අනෙකුත් මුස්ලිම්වරුන් සමග ඔහු මුස්ලිම්වරයෙකු වශයෙන් තබන්නා වූ ආදරය.**

**(4). මිනිසෙකු වශයෙන් අනෙකුත් මිනිස් සමූහයට තබන්නාවූ ආදරය.**

**(5). මිනිස් සමූහයට වඩා පහත් වූ අනෙකුත් සත්වයන් හා ජීවින්ට තබන්නාවූ ආදරය.**

ඉහත සඳහන් කළ සෑම කොටසක් සමග ම තබන්නා වූ ආදරය හා එයට ඇති සීමාවන් වෙනස් වන්නේ ය. ඒවා අප අධ්‍යයනය කර අපට සීමිතවූ සීමාවන් තුළ ආදරය තබනා විට අපගේ මෙලොව පරලොව ජීවිතය සතුටුදයක වන්නේ ය.

ගැත්තන් තමන්ගේ ස්වාමියා වන අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට තබන්නාවූ ආදරය, විශ්වාසවන්ත භාවයේ සළකුණු වන්නේ ය. මේ ගැන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් "කෙනෙකුට අල්ලාහ් හා ඔහුගේ නබි තුමාණන් අන් සැම දෙනෙකුට ම වඩා අධික ආදරය ඇත්තන් වන්නේ නම් ඔහු ඊමානයේ රස විඳින්නේ ය." යනුවෙන් පවසා ඇත. අල්ලාහ්ට හා ඔහුගේ දූතයාට ආදරය කිරීමේ සලකුණු නම් ඔහුගේ යුතුකම් හා ඔහුගේ වචනයන් ඉදිරියේ අනෙකුත් කිසිම දෙයක් උසස් ලෙස තෝරාගෙන සිටීම, දෙමාපියන්, දරුවන් හා අනෙකුත් සියලු දෙනාට තබන්නාවූ ආදරය, ඉහත කී අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන් වන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් හට තබන්නාවූ ආදරයට වඩා උසස් නොවිය යුතුයි. මෙය ඊමානය සම්පූර්ණ වීමේ තත්වය වන්නේ ය.

අල්ලාහ්ට පමණක් නැමදුම් කිරීම ද ඔහුගෙන් ම පමණක් අවශ්‍යතාවයන් ලබා ගැනීම ද අල්ලාහ් හට ආදරය දැක්වීමේ එක් කොටසකි. එලෙස ම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ සුන්නාවන් හා ඔවුන්ගේ ගති පැවතුම් එක් මුඃමින් වරයෙකු තුළ අනෙකුත් අයගේ ගති පැවතුම් වලට වඩා උසස්ව තිබිය යුතුයි.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ පවුලේ සමාජිකයන් හට, ඔහුට සහාය ව සිටි සහාබිවරුන් හට ඔහුගේ ජීවිතය ආරක්ෂා කරන්නාවූ ආලිම්වරු, සාලිහින්වරු හට ආදරය කිරීම ඊමානයේ කොටසකි. ඔවුන් ඔවුන්ගේ තත්ත්වය උසස් කරන ලෙස අල්ලාහ්ගේන් දුආ ප්‍රර්ථනා කිරීම ද ඔවුන් අල්ලාහ්ගේ වගකීම ඉටු කිරීමට පෙන් වූ ඇල්ම, උදහරණයක් ලෙස ගෙන එය අනුගමනය කිරීම ද ඔවුන්ට අප පෙන්වන්නා වූ සත්‍ය ආදරය වන්නේ ය.

දෙමාපියන් හා නෑදෑ හිතවතුන් සමග ආදරයෙන් හා ගෞරවයෙන් හැසිරිය යුතුයි. ඔවුන් වෙනුවෙන් අල්ලාහ් ගෙන් දුආ ප්‍රර්ථනා කළ යුතුයි.

- ♦ මුස්ලිම්වරයෙකු වශයෙන් අනෙකුත් මුස්ලිම්වරුන් සමග ආදරයෙන් හා සෙනෙහසින් හැසිරීම අනිවාර්ය වේ. සෑම මුස්ලිම්වරයෙකුගේ ම ප්‍රාණයට, වස්තූන්ට හා ඔහුගේ ගෞරවයට අවමන් නොවන පරිදි හැසිරීම, ඔවුන්ට පෙන්වන්නාවූ ආදරය වේ. එසේ ම එක් මුස්ලිම්වරයෙකු තවත් මුස්ලිම්වරයෙකුට කළ යුතු ප්‍රධාන යුතුකම් මෙම ආදරයේ ප්‍රධාන සලකුණකි. ඒවායින් සලාමයට පිළිතුරු දීම, රෝගීන්ගේ සුවදුක් විමසීම, ජනාසාවට සහභාගි වීම, භෝජන සංග්‍රයට ආරාධනා කරනු ලැබුවහොත් එහි යෑම, කිවිසුම් ගිය විට අල්ලාහ්ට ප්‍රශංසා කිරීම හා එයට පිළිතුර දීම, යනාදිය ප්‍රධාන කොට සැලකේ.
- ♦ මිනිසෙකු වශයෙන් මුස්ලිම් නොවන අය සමග ද ආදරයෙන්, සැලකිල්ලෙන් හැසිරිය යුතුයි. විශේෂයෙන් බහුතර සමාජයක් සමග ජීවත්වන ප්‍රදේශයන් හි මුස්ලිම් වරුන් පෙන්වන ආදරය හා සෙනෙහස ඔවුන්ගේ සිත් ඇදගැනීමට කාරණයක් වේ. ඔවුන් අප හට ආදරය කිරීමට ද, ගෞරවය කිරීමට ද, පෙළඹෙන අතර විශාල වශයෙන් ඇතිවන ජාති භේද ප්‍රශ්න හා සමාජීය ප්‍රශ්න ඇති නොවීමට හේතු වේ.

මහල්ලන්, රෝගීන්, කුඩා ළමුන් හා ආබාධිතයන් සමග ජාති භේදයකින් තොරව ආදරය පෙන් වන ලෙස ඉස්ලාමය බල කරයි. නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණන් එක් හදීසයක

"මිනිසුන් සමග ආදරය නොකරන්නා හට අල්ලාහ් ආදරය නොකරයි" යනුවෙන් පවසා ඇත. (බුහාෘරි)

තව ද කෙනෙකු මුස්ලිම්වරයෙකු වශයෙන් අනාථයන්, අසරණයන්, සේවකයින් තමන් යටතේ සිටින අය හා අසල් වැසියන් සියලු දෙනාට ම ආදරය කළ යුතුයි. තව ද මුස්ලිම් නොවන්නන් යහමගට හැරවීම පිණිස අල්ලාහ්ගෙන් දුආ ප්‍රාර්ථනා කිරීම ඔවුන්ට පෙන්වන්නාවූ ආදරයෙන් කොටසකි.

මිනිසාට පමණක් නොව සත්වයන්ට ආදරය කරුණාව පෙන්වන තරම් ආදරයේ සීමාව විශාල වී ඇත. පිපාසයෙන් සිටි සුනඛයෙකුට ජලය පානය කිරීමට දුන් දුරාචාරයේ යෙදෙන ස්ත්‍රියකට, අල්ලාහ්ගේ සමාව ලැබුණු අතර බළලෙකුව නිදහසේ යෑමට ඉඩ නොහැර ගැටගසා වේදනා කළ ස්ත්‍රියක් දඬුවම් ලැබූ බව අපි හදීස් මගින් දැන සිටින්නෙමු. එම නිසා අප ඉහත කී සිමාවන් සමග ආදරයෙන් හා දයාවෙන් ජීවත් වීමට ආදර්ශයත් වෙමු.

## දන්දීම

දන් දීම කරුණාවන්ත භාවයේ හෙළි දැක් වීමකි. අල්ලාහ් තමන්ට පිරිනැමූ ධනයෙන් කොටසක් අනුන්ට දීම දන් දීම නම් වේ. මෙය ඉස්ලාමීය ගුණාංගයන්ගෙන් ඉතා සැලකිය යුතු ගුණාංගයකි. අල්ලාහ් සුවිශාල දනපතියා ය. තමන්ගේ ගැත්තන්ට ඔහු විසින් දායාදය කරන ලද දේවල් සෙසු ගැත්තන් සමග බෙදා හදා ගත යුතු යැයි ඔහු අදහස් කරයි. මේ ගැන අල්කුර්ආනයේ

" اَلَّذِيْنَ يُنْفِقُوْنَ اَمْوَالَهُمْ بِاللَّيْلِ وَالنَّهَارِ سِرًّا وَعَلَانِيَةً فَلَهُمْ اَجْرُهُمْ عِنْدَ رَبِّهِمْ "

"යම් කිසි කෙනෙක් තම වස්තුවෙන් රෑ දවල් දෙකෙහි රහසින් හා ප්‍රසිද්ධියේ (දන්දිම පිණිස) වියදම් කරන්නේ ද, ඔවුනට ඔවුන්ගේ රබ්බුගෙන් කුලිය ඇත" යනුවෙන් පවසයි.

දෙදෙනෙකු හැර අන් කිසිම කෙනෙකු හට ඊර්ෂ්‍යා නොකළ යුතුයි. එයින් පළමුවැන්නා ඔහුට අල්ලාහ් ඥානය දී ඇත. රෑ දවල් දෙකෙහි ඔහු එය ප්‍රයෝජනවත් ලෙස උපයෝගි කරන්නේ ය. දෙවැන්නා අල්ලාහ් ඔහුට ධනය දී ඇත. ඔහු රෑ දවල් දෙකෙහි අල්ලාහ් කැමති මාර්ගයේ වියදම් කරන්නේ ය.

තමා ලද ධනයෙන් තමා හා තම පවුලේ උදවිය භුක්ති විඳීමෙහි හා අවශ්‍යතාවන් ඉටු කර ගැනීමෙහි වරදක් නොමැත. නමුත් ඔහුට එම ධනය ලබාදුන් කෙනා (අල්ලාහ්) සෙස්සන් හට දෙන මෙන් පවසන විට ඔහුගේ අණ පිළිපැදීම සත්‍ය ගැත්තන්ගේ ගුණාංගයන් නොවේ ද? ඔහු (අල්ලාහ්) සිතුවහොත් එම ධනය අපගෙන් ආපසු ගෙන වෙනත් කෙනෙකුට දීමට තරම් ශක්තිවන්තයෙකි. අල්ලාහ් "කුර්ආනයේ,"

" لَئِنْ شَكَرْتُمْ لَاَزِيْدَنَّكُمْ وَلَئِنْ كَفَرْتُمْ اِنَّ عَذَابِيْ لَشَدِيْدٌ "

"ඔබලා (අල්ලාහ් දුන් දයාදයන්ට) ප්‍රශංසා කරන්නේ නම් මම එය ඔබලාට වැඩි කරන්නෙමි. ඔබලා (එයට) පටහැනි වන්නේ නම් නිශ්චය වශයෙන් ම මාගේ දඬුවම දරුණුය." යනුවෙන් පවසා ඇත. (14:7) අපට ලැබූ දයාදයන්ට අප ප්‍රශංසා කිරීම නම් අප එම දයාදයන් අල්ලාහ් කැමති මාර්ගයේ උපයෝගි කිරීමයි.

පොදුවේ මිනිස් අවශ්‍යතාවන් වැඩි වශයෙන් ද සම්පත් අඩුවෙන් ද තිබීම නිසා අල්ලාහ් දන්දීම්, උපකාර කිරීම් මගින් අවශ්‍යතාවයන්ට වඩා අඩුව ඇති සම්පත් තමන් අතර සිත් කැමැත්තෙන් බෙදා හදා ගැනීමට අනුබල දෙන්නේ ය. මෙලොව වස්තූන් වෙත සිත් යොමු වී ඇති වන්නාවූ ආශාවන්, ලෝබකම, ආත්මාර්ථකාමී භාවය වැනි අයහපත් ගුණාංගයන් අතහැර සිත පාරිශුද්ධව තබාගැනීම ඉස්ලාමයේ අරමුණුවලින් එකකි.

මෙම අයහපත් ගුණාංගයන් නිසා ම මිනිසුන් අතර විරෝධය හා ක්‍රෝධය වැඩි තරගකාරීත්වය හා ඊර්ෂ්‍යාව ඇති වන අතර සමාජයේ එකමුතුභාවය කැඩියාමට හේතු වන්නේ ය. එමනිසා අනුන්ට උපකාර කරමින් ජීවත් වීම මිනිසාව මෙලොව ගෞරවාන්විත වූ පුද්ගලයෙකු කරන අතර පරලොවහි ද අල්ලාහ්ගේ කරුණාව හා දයාව ලබා දෙන්නේ ය. මේ පිළිබඳව අල්ලාහ් කුර්ආනයේ.

"එම නිසා ඔබලාගේ ආත්මයට යහපතක් වීම පිණිස ඔබලා හැකි පමණින් අල්ලාහ්ට බය භක්තිය පෙන්වන්න. තවද ඔහුට ඇහුම්කන් දෙමින් ද, අවනත වෙමින් ද, දන් දෙන්න. කවරෙකු මසුරු කමින් මුදවා ගන්නේ ද ඔවුන් නියත වශයෙන් ම ජය ලැබුවෝ වෙති." (64:16)

කෙනෙකු දන් දෙන විට තමන්ගේ මුදල් අඩුවන්නා සේ පෙනේ. නමුත් නබි තුමාණන් "දන් දීම මගින් මුදල් අඩු නොවේ." යනුවෙන් දිවුරා පවසා ඇත. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ඉතා විශිෂ්ට දානපතියෙක් ව සිටියේ ය. හමන්නා සුළඟට වඩා වේගයෙන් දන්දෙන්නෙක් වැජඹෙන්නේ ය. (බුහාරි)

සහාබි වරුන් ගේ දන් දිමේ ඉතිහාසය ගැන බලන විට ඔවුන් නිත්‍ය වශයෙන් ම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ මිත්‍රයන් වීමට සුදුසු අය බව පැහැදිලි වේ.

යම් කිසි කෙනෙකු දන්දීම් කටයුතුවල නියලෙන විට පහත සඳහන් ආනිසංස (කුසල්) අත් කර ගන්නේ ය.

**1). මෙලොව අල්ලාහ්ගේ ආදරය ද ජනයන් අතර සුහදත්වය ඇතිවේ.**
**2). පරලොවෙහි දී සුවිශේෂ ආනිසංස (කුසල්) හිමි කර ගනී.**
**3). ධනයෙහි අභිවෘද්ධිය ඇති වේ.**
**4). සිදු වීමට තිබෙන ආපදා, විපත් ආදිය ඉවත් වන්නේ ය.**
**5). මෙලොව වස්තූන් පිළිබඳ මෝහය (අශාව) තුරන් වී සිත පාරිශුද්ධ වන්නේය.**

## පරිත්‍යාගශීලී භාවය

දන් දීමෙහි උසස් ම තත්වය පරිත්‍යාගශීලී භාවය වේ. අල්ලාහ් වෙනුවෙන් යන පිවිතුරු චේතනාවෙන් කායික වශයෙන් හෝ ධන සම්පත්වලින් අනුන්ට පිහිට වනවිට හා අල්ලාහ්ගේ වගකීම් ඉටු කරන විට ඇතිවන දුක්කරදර ඉවසා දරා ගැනීම පරිත්‍යාගශීලී භාවය නම් වේ. කෙනෙකුට මුදල් හෝ වස්තූන් අත්‍යවශ්‍යව තිබෙන අවස්ථාවක තමන්ගේ අවශ්‍යතාවය නොතකා අනුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම ද අනුන්ට පිහිට වීමට කිසිදු බලපෑමක් නොමැතිව තමන්ගේ යහපත ද නොතකා පිහිටවීම පරිත්‍යාගශීලී භාවය නම් වේ.

ඉස්ලාමය අනුබල දෙන උසස් වර්ණනා අතුරින් පරිත්‍යාගශීලී භාවය මුල් තැන ගනියි. සීමිත කෙටි කාලයක් තුළ ඉස්ලාමය ලොව බොහෝ ස්ථානයන් කරා පැතිර යෑමට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ ද, ඔහුගේ සහාබිවරුන්ගේ ද පරිත්‍යාගශීලී භාවය ප්‍රධාන හේතුවක් විය.

ඉස්ලාමයේ ආරම්භ කාලයේ දී මුස්ලිම්වරු කාෆිර්වරුන්ගෙන් බොහෝ දුක් කම්කටොලු වලට මුහුණපෑවෝ ය. පරිත්‍යාගශීලී භාවය දේශනා කිරීමට මෙන් කුර්ආනයේ මක්කා වැසියන් කාෆිර්වරුන් සමග කෙසේ හැසිරිය යුතු ද? යන්න පවසයි.

"විශ්වාස වන්තයිනි! ඔබලාගේ දෑත් (හිරිහැර කිරිමෙන්) වළක්වා ගන්න." අවසාන වශයෙන් ඔවුන් තමන්ගේ ගේදොර, ඉඩ කඩම්, දේපල, සියල්ල අල්ලාහ් වෙනුවෙන් අත හැර හිජ්රත් කළෝ ය. මේ ගැන අල්ලාහ් කුර්ආනයේ.

"තම ගෙවල් දොරවල් ද තමන් සතු වස්තූන් ද අතහැර දමා (අසාධාරණ ලෙස) පිටමන් කරනු ලැබූ (මක්කාවෙන්) හිජ්රත් කර පැමිණි දුගීන්ට ද, (එයින් කොටසක් හිමිවන්නේය) ඔවුහු අල්ලාහ්ගේ දයාදය හා සතුට අත්කර ගැනීමේ අරමුණින් (තම ජීවිතය හා වස්තූන් පරිත්‍යාග කර) අල්ලාහ්ට සහ ඔහුගේ රසූල්වරයාට උදව් කරමින් සිටිති. ඔවුහු සත්‍යවන්තයන් වන්නෝ ය." (59: 8)

මුස්ලිම්වරුන්ට සතුරන්ගේ තර්ජන එල්ල වූ අවස්ථාවල සහාබිවරු අතර සිටි ධනවතුන් තමන්ගේ ධනයෙන් විශාල කොටසක් ඉස්ලාමය වෙනුවෙන් පරිත්‍යාග කළ අවස්ථා එමට ය. හිජ්රි 9 වන වර්ෂයේ අරාබියේ දරුණු නියඟයක් (පෑවිල්ලක්) ඇති විය. එවිට රෝමයේ අධිරාජ්‍යයා වූ හිර්කල් (හර්ක්‍යුලිස්) මුස්ලිම්වරුන්ට විරුද්ධව සේනාවක් සූදානම් කළේ ය. (මුස්ලිම්වරුන්ට) එයට විරුද්ධව සේනාවක් රැස්කිරීමට විශාල ධනස්කන්ධයක් අවශ්‍ය විය. සාගත නිසා සහාබාවරුන් තුළ ද බොහෝ අඟ හිඟකම් විය. උස්මාන් (රලියල්ලාහු අන්හු) තුමා ඒ අවස්ථාවේ දී තමන්ගේ ධනයෙන් විශාල කොටසක් මුස්ලිම්වරුන්ගේ අවශ්‍යතාවයන් සඳහා පරිත්‍යාග කළේ ය. මෙයින් සතුටට පත් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා "මින් පසු උස්මාන් ගෙන් සිදුවන්නා වැරදි වලට උස්මාන් දුක් වීමට අවශ්‍ය නැත" යනුවෙන් පැවසුවේ ය.

බොහෝ සහාබිවරු තම නිවසේ තිබූ සෑම වස්තුවක් ම පරිත්‍යාග කළෝ ය. සමහරු කුලී වැඩ කර එයින් ලැබෙන කුලිය සදකා වශයෙන් දුන්නෝ ය. මෙලෙස සහාබිවරුන් තමන්ගේ අවශ්‍යතාවයන් සුලුකොට සලකා ඉස්ලාමය හා මුස්ලිම්වරුන්ව ආරක්ෂා කිරීමට ගත් උත්සාහයන් බොහොමයක් අපි දන ඇත්තෙමු. මේ සියල්ල එම සහාබිවරුන්ගේ පරිත්‍යාගශීලි භාවය එළි දැක්වීමකි.

අල්ලාහ්ගේ තෘප්තිය පමණක් බලාපොරොත්තුවෙන් ඔහු වෙනුවෙන් පරිත්‍යාග කරන්නන්ට අල්ලාහ් ඉතා කැමැති වන්නේ ය. පහත සඳහන් සිද්ධියෙන් අපට එය වටහාගත හැක. කෙනෙකු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙත පැමිණ තමන්ගේ දරිද්‍රතාවය හා සාගින්න ගැන පැමිණිලි කළේ ය. එම පුද්ගලයාට කුමක් හෝ දීම පිණිස තමන්ගේ භාර්යාවන්ගේ නිවෙස්වල කුමක් හෝ ඇත්දැයි බලා කිසිවක් නොලැබ ආ විට තමන්ගේ මිත්‍රයන්ගෙන් "අද රාත්‍රියෙහි මොහුට ආහාර සැපයීමට කවරෙක් හෝ සිටින්නේ ද? අල්ලාහ් ඔහුට ආශිර්වාදය කරන්නේ ය" යනුවෙන් පැවසුවේ ය. එය ඇසූ අන්සාරි සහාබිවරයෙකු "අල්ලාහ්ගේ රසූල්වරයාණනි! මම ඔහුට ආහාර සපයන්නෙමි" යනුවෙන් පවසා, ඔහු කැටුව තම නිවසට ගියේ ය. තමන්ගේ භාර්යාවට අල්ලාහ්ගේ රසූල්වරයාගේ ආගන්තුකයෙකු පැමිණ ඇත. ඔබ කිසිවක් ඉතිරි නොකරන්නයැයි පැවසුවේ ය. එම ස්ත්‍රිය "දරුවන්ගේ කෑම හැර අන් කිසිවක් මා හට නැතැයි පැවසුවාය" එසේ නම් ඔවුන් ව නිදිකරවන්න යැයි පැවසුවේ ය. ඇය තම දරුවන් නිදි කරවා පසුව ආගන්තුකයා කෑමට හිඳගත් විට ලාම්පුව හරි ගස්සන්නාක් මෙන් එය නිවා දමන්න යැයි ඔහු ඇයට පැවසුවේ ය. ඇය ද එලෙස ම කළා ය. පසුදින එම අන්සාරි සහාබිවරයා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මුණගැසුණු අවස්ථාවේ දි "ඔබලා දෙදෙනාගේ ක්‍රියාවෙන් අල්ලාහ් තෘප්තිමත් විය." යනුවෙන් පවසා පහත සඳහන් කුර්ආන් වැකිය පාරායන කර පෙන්වූයේ ය :

" وَيُؤْثِرُونَ عَلَىٰ أَنفُسِهِمْ وَلَوْ كَانَ بِهِمْ خَصَاصَةٌ "

"තමන්ට අවශ්‍යතාවය තිබියදීත් ඔවුන් තමන්ට වඩා (අනුන්ව, මුහාජිරින්වරුන්ව) තෝරා ගත්හ." (59:9)

අල්ලාහ් පරිත්‍යාගශීලීන් ප්‍රියකරන බවට නබි ඉබ්‍රාහීම් අලෛහි වසල්ලම් තුමාණන්ගේ ඉතිහාසය කදිම සාක්ෂියක් ලෙස දිස්වේ.

## පරිත්‍යාගශීලි භාවයේ ප්‍රතිඵලයන් කෙටියෙන් සලකා බලමු

- පරිත්‍යාගශීලි භාවය ඉස්ලාමීය නීතින් අනුව සැකසෙන විට අල්ලාහ්ගේ ආදරය මෙලොව හා පරලොවෙහි දී ලබා ගත හැක.
- පරිත්‍යාගශීලි හැඟීම තමන්ට වඩා අන් අයගේ යහපත තැකීම බැවින් ලොවෙහි එකමුතු භාවය ඇති වේ.
- තනි මිනිසෙකුට සියලුදේ කිරීම අපහසු කාර්යයකි. මිනිස් සමූහය සමගියෙන් හා පරිත්‍යාගශීලි හැඟීමෙන් ක්‍රියා කරන විට ඉතා ශීඝ්‍රයෙන් එම සමාජය සංවර්ධන වේ.
- එම නිසා අප පරිත්‍යාගශීලි හැඟීමෙන් ජීවත් වීමට පුරුදු වන අතර අන් අය ද මෙයට උත්සුක කළ යුතුයි.

එම නිසා ආදරය, දන්දීම, පරිත්‍යාගශීලීභාවය වැනි යහගුණාංග මිනිස් වර්ගයා එක් පවුලක් බවට පත් කර ජීවිතයේ සතුටක් ඇති කරන අතර අවම සම්පත් තමන් අතර බෙදා හදා ගැනීමටත් උනන්දු කරවයි. මෙය මගින් ආර්ථික ගැටලුවලට ඉතා සැහැල්ලු මාර්ගයක් ඉස්ලාමය ඉදිරිපත් කර ඇත. එම නිසා අපි මෙම ගුණාංග ඇතිකර ගෙන අපට හා සමාජයට ඵලදායී පුද්ගලයන් වෙමු.

### අභ්‍යාස

1). ආදරය මගින් ලැබෙන ප්‍රධාන ප්‍රයෝජනයන් තුනක් පැහැදිලි කරන්න.
2). "දරදඬු භාවයෙන් කිරීමට නොහැකි දෙයක් ආදරය මගින් කිරීමට හැකි ය" යන්නට ඔබගේ ජීවිතයේ සිදු වූ සිදුවීමක් සඳහන් කරන්න.
3). දන්දීමේ ප්‍රයෝජනය සඳහන් කරන්නාවූ කුර්ආන් වැකි දෙකක් හා හදීස් දෙකක් සඳහන් කරන්න.
4). පරිත්‍යාගශීලි භාවය ගෙන හැර දක්වන සහාබිවරුන්ගේ සිද්ධීන් 2ක් සඳහන් කරන්න.

## 3.3 තරුණ වියේ ඇති ප්‍රයෝජන

- තාරුණ්‍යය නැවත නොලැබෙන දේව වරප්‍රසාදයකි.
- තාරුණ්‍යය නිසි ලෙස පරිහරණය කරන්නාගේ අනාගතය ආලෝකවත් වේ.
- තාරුණ්‍යයේ වගකීම් හොඳින් දැන ක්‍රියාකරමු.

මේ දක්වා අපි මිනිසාව උසස් කරන්නාවූ ශ්‍රේෂ්ඨ ගුණාංග ගැන සලකා බැලුවෙමු. මෙම ගුණාංගයන් මිනිසාගේ කුඩා අවදියේ සිට මරණය දක්වා පැවතිය යුතුයි.

එනමුත් යොවුන් වියේ දි මෙම ගුණාංගයන් ලබාගත් පුද්ගලයා ඉතා උතුම් භාග්‍ය වන්තයෙකි. මන් ද යත් කුඩා වියේ හා මහලු වියේ දී දක්නට ලැබෙන දුර්වලතාවන් තරුණ වියේ දි ඇති නොවේ. එනමුත් ක්‍රියාත්මක විය හැකි, මානසිකත්වය, කායික ශක්තිය, නිර්භීත භාවය, මුරණ්ඩු කම, හදිස්සිය, නවීනත්වයට ඇති ආශාව යනා දී ගුණාංග හා හැකියාවන් තරුණ වියේ දී බහුලව දක්නට ලැබේ. දඟකාර ආවේගශීලි භාවය මත සැකසෙන යොවුන් සමාජය, ඕනෑම සමාජයක ජීවනාලිය වන්නේ ය. මෙය හේතුකොට ගෙන නබි සල්ලල්ලාහු අලෙහි වසල්ලම් "කියාමත් දිනයේ සෙවණැල්ලක් ලබන්නාවූ කණ්ඩායම් හතෙන් අල්ලාහ්ව සතුටු කරන ආකාරයට යොවුන් විය ගත කළ තරුණයින් ද එක් කණ්ඩායමක්සේ සලකනු ලබයි" යනුවෙන් පැවසූහ.

යොවුන් වියේ පසුවන ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වය ඔවුන්ගේ ක්‍රියා කලාපයන් අනුව කොටස් දෙකකට බෙදෙයි. ඉන් පළමු පාර්ශ්වය තම යොවුන් වියේ ඇති තාරුණ්‍ය භාවය මැනවින් උපයෝගී කොට තමා තුළ සැඟවී ඇති සහජ කුසලතාවයන් හා දක්ෂකම් පෙන්නුම් කරයි. ඒ සමග ඉස්ලාමය පෙන්වන්නාවූ ශ්‍රේෂ්ඨ ගුණාංගයන් මූලික කොට ගෙන එම යෞවනය මෙලොව හා පරලොව ප්‍රයෝජනවත් ක්‍රියා කටයුතුවල යොදවා ගනියි. ඒ සඳහා ලැබෙන අවස්ථාව නැවත ලබා ගැනීමට නොහැකි උතුම් වස්තුවක් ලෙස සලකා සෑම දෙයක් ම හැඳින ගෙන ප්‍රයෝජනවත් කාර්යයන් වල වියදම් කරයි. නිෂ්ප්‍රයෝජන දේවල්වල හා අන් අයගේ විෂයයන් වලට මැදිහත් වී කාලය අපතේ නොහරියි. පුරාණ විද්වතුන් බොහෝමයක් තමන්ගේ තරුණ විය හරිහැටි පරිහරණය කළ හේතුවෙන් මරණින් පසුව ද ඔවුන්ගේ ගෞරවය රැඳී තිබීම අපි දකින්නෙමු. තරුණ වියේ දී හා ආරෝග්‍යමත් ව සිටින අවස්ථාවේ දී කෙනෙකු යහ ක්‍රියාවන්වල නියැලී සිට වයෝවෘද්ධත්වයේ දීත් රෝගී වූ අවස්ථාවේදී ත් එම යහ ක්‍රියාවන් කිරීමට අපහසු වුව ද එයට අයත් කුසල් නොකඩවා ලැබෙන්නේ ය යි නබිතුමාණෝ පැවසුවෝ ය.

"ගැත්තන් රෝගී වූ විට හෝ ගමනක යෙදුන විට නිරෝගීව සිටින විට හෝ තමාගේ ගමේ සිටින විට කරනු ලැබූ යහ ක්‍රියාවන් හි කුසල් ඔහුට ලැබෙනු ඇත."

(බුහාරී)

දෙවන පාර්ශ්විකයෝ තම යොවුන් විය, සෙල්ලම් වියක් ලෙස සලකන එය විනෝද ක්‍රියාවලියේ ද අයුතු සෙල්ලම්වල ද අනුන්ගේ සිත් රිදවීමෙන් ද කල් ගෙවන්නෝ ය. තව ද මෙය සදාචාර ක්‍රියාවක් ලෙස ද සලකති. නරක (දුෂ්ඨ) ශක්තීන් හා ශෛතාන් යොවුන් වියේ ඇති ආවේගශීලි භාවය ප්‍රයෝජනයට ගෙන පරලොව ජීවිතය විනාශ කිරීමට සෑම විට ම උත්සාහ දරන්නේ ය. එම යෞවනයේ ඇතිකරගන්නාවූ ක්‍රියා පටිපාටීන් මරණය දක්වා රැඳෙන්නේ ය. එසේ සැකසුණ තරුණයා ස්වකීය ජීවිතය විනාශ කරනු පමණක් නොව තමා වටා ඇති සමාජයට ද තමා ජීවත් වන ලෝකයට ද ප්‍රශ්න ඇතිකරන්නෙකු බවට පත් වන්නේ ය. එමනිසා යෞවනයේ වටිනාකම දැනගත් අපි අපගේ යෞවනය කෙසේ සකස්කරගත යුතු ද? යන්න දැන් සලකා බලමු.

## 3.4 තරුණ කාලයේ ඉටුකළ යුතු සේවාවන්

**තරුණයන් වන අප අපගේ තරුණ විය පහත සඳහන් පරිදි සකස් කර ගනිමු**

1). අපට අල්ලාහ් විසින් අණකරන ලද යුතුකම් වේලාව නොවරදවා කර ගනිමු.
2). අප අපගේ අනාගතය වෙනුවෙන් එක් අරමුණක් පෙරටු කරගෙන ඒ වෙනුවෙන් සියයට සියයක් (මුළුමනින් ම) උත්සාහ කරමු.
3). අපි දෙමාපියන්ට, පවුලේ උදවියට බරක් නොවී අනාගත අරමුණු සඳහා බාධා නොවන පරිදි අපගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට උත්සුක වෙමු.
4). අපගේ ක්‍රියාවන් දෙමාපියන්ට උදව්වන පරිදි (උපකාරවන පරිදි) සකස් කර ගනිමු.
5). අපගේ මෙලෝ ජීවිතයට හා පරලොව ජීවිතයට ප්‍රයෝජන ගෙන දෙන මිත්‍රයන් සමග එක්ව සිටිමු. හොඳ පොත් පත් කියවීම් සාමුහික සාකච්ජාවල යෙදීම්, සමාජයට අවශ්‍ය නිර්මාණශීලි සේවාවන්වල යෙදීම් වැනි ක්‍රියාවන්හි නියැළෙමු.
6). නිරෝගීභාවය අල්ලාහ් දුන් දායාදයක් ලෙස සලකා එය ආරක්ෂා කරගනිමු. ශරීර ශක්තියට අවශ්‍ය පෝෂණ කාරක ආහාර, ශාරීරික අභ්‍යාස, අවශ්‍යවන නින්ද, නුසුදුසු ආහාර හා බීම වර්ගවලින් වැළකී සිටීම යනාදියෙහි ලා සැලකිලිමත් වෙමු.
7). වේලාව අපතේ යවමින් අපගේ සිත් හා ශරීර විනාශකරන්නා වූ වැරදි ක්‍රියාවන් වලින් අප ආරක්ෂා කර ගනිමු. ඉස්ලාම් ධර්මයෙහි අනුමැතිය නොලත් ස්ත්‍රී පුරුෂ සම්බන්ධකම් වළක්වා ගනිමු.

හරාම් වූ අලංකාරයන්, නරක හැඟීම් ඇති කරන්නාවූ චිත්‍රපට, ඇඳුම්, අන්‍ය ස්ත්‍රී පුරුෂයන් එකතු වූ ප්‍රීති උත්සවයන්, දුම් බීම, මත් ද්‍රව්‍ය පාවිච්චිය, සිත් රිදවන්නා සුලු විහිළු තහළු, පහත් කොට සලකන්නා වූ හැඟීම්, හැසිරීමට හා බැලීමට ඉස්ලාමය තහනම් කර ඇති දේ බැලීම හා ඇසීම වැනි ක්‍රියාවන්, තරුණයන්ට නුසුදුසු කරුණුවලට උදහරණ ලෙස ගත හැක.

නවීන ලෝකය, පිරිමින් හා ස්ත්‍රීන් එක සමාන කොටසක් ලෙස සලකයි. නමුත් ඉස්ලාමය ඔවුනොවුන් ගේ ගුණාංගයන්ට හා ස්වභාවයන්ට අනුව වෙන්කර දක්වයි. කන්‍යාභාවය යනු දෙපාර්ශවයටම පොදු වූ දෙයකි. එම නිසා හිජාබ් පැළඳීම මඟින් යෞවනියන් ස්වකීය අලංකාරය සඟවා ගත යුතු අතර දෙපාර්ශවය ම තමන්ගේ චරිතය, හැසිරීම්, ඇඳුම් පැළඳුම් හා ඉස්ලාමයේ පෙන්වා ඇති සීමාව නොඉක්ම විය යුතු අතර තමන්ගේ කන්‍යාභාවය මෙන් අන්අයගෙ කන්‍යාභාවය රැකීම අනිවාර්ය වේ. මේ සඳහා තරුණ තරුණියන් අල්ලාහ්ගේ ඔහුගේ දූතයාගේ හා පරලොව ගැන විශ්වාසය දැඩි කළ යුතුයි. අල්ලාහ්ගේ හා ඔහුගේ දූතයාගේ උපදෙස් පිළිගෙන ක්‍රියා කරන අතර යහ ක්‍රියාවන්ට උදව් උපකාර කරන මිත්‍රයන් හා සමාජයක් තෝරා ගත යුතු අතර පව් වෙත රැගෙන යන සියලු ම මාර්ගයන්ගෙන් ආරක්ෂා විය යුතුයි.

## අභ්‍යාස

1). සහාබි වරුන්ගෙන් තමන්ගේ තරුණ විය "දීන්" නැමැති සත් ධර්මය වෙනුවෙන් ක්‍රියාකල තරුණයින් දෙදෙනෙකු සඳහන් කරන්න.

2). තරුණවියේ කළ යුතු ප්‍රධාන සේවාවන් තුනක් පවසන්න.

3). අපගේ තරුණ විය ගත කළ යුතු අන්දම ගැන වාක්‍ය 10 ක කුඩා රචනාවක් ලියන්න.